# MANRECAP මාසික පුවත් නිවේදනය #12

| 01-2006 සිට 04-2006 | # 12 |
|---|---|

## 1 වන උප ලේඛනය - ශාන්ති පුරම් ග්‍රාමයේ දියුණුව

### 1.1 විවිධ සේවා සමුපකාර සමිති පිහිටි ගොඩනැගිල්ල සාදා නිමකිරීම



ශාන්ති පුරම් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ වගකීම සහ ප්‍රජා කළමනාකරණ පුනරුත්තාපන කටයුතු භාරගැනීම තුලින් ද අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන සහ වෙනත් පහසුකම් මැන්රිකැප් සංවිධානයෙන් සැපයීම තුලින් ද මේ ගොඩනැගිල්ල ඉක්මනින් ම සාදවා නිම කිරීමට හැකිවී තිබේ. මේ කරුණ නිසාම ශාන්ති පුරම් වැසියනට දීර්ඝ කාලීනව පැවැති අවශ්‍යතාවයක් වන විවිධ සේවා සමුපකාර සමිති ශාඛා වට නිවහනක් ලබාගැනීමට හැකිවිය. එහෙයින් මේ ප්‍රදේශවාසීනට ඔවුනට අවශ්‍ය බඩු බාහිරාදිය එකම මධ්‍යස්ථානයකින් ලබා ගැනීමට හැකිවීම ලොකු පහසුවක් විය.

### 1.2

පලතුරු ගස් සහ සෙවනට ගස් සිටුවීම ලුණු මිශ්‍ර පසක් ඇති ජලය හිඟ කමින් පීඩා විදින මෙවැනි !ප්‍රදේශයකට මන්රිකැප් ආයතනයේ කෘෂි සේවා නිලධාරීන්ගේ මඟ පෙන්වීම යටතේ සහ කාන්තා සංවිධානයේ සහයෝගිතාවය ඇතිව (විශේෂ කොම්පෝස් පොහොර සමග පැල සිටුවීම සදහා වල සකස් කරන ආකාරය) සෙවනට ගස් සිටුවීම සහ පලතුරු පැල සිටුවන ක්‍රමය සාර්ථකව නිම කර ඇත.

### 1.3 තල් ආශ්‍රිත නිෂ්පාදන සදහා පුහුණුව.



ශතල් සංවර්ධන මණ්ඩලයේ පුහුණුව ලැබූ නිලධාරියෙකු යටතේ ශාන්ත පුරම් ප්‍රදේශයේ කාන්තාවන් 15 දෙනෙකු තල් ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ නිෂ්පාදනය සදහා අවශ්‍ය පුහුණුව ලබමින් සිටිති. මේ වකවානුව වන විට ඔවුන් එයට සුදුසු වෙළඳ පොලක් සොයමින් සිටිති. මෙය සොයාගත්තායින් පසුව මේ කාන්තාවන්ට මෙය ස්ථිර ආදායමක් උපයන ජීවන මාර්ගයක් වනු ඇත.

## 2 වන උප ලේඛනය :- සේවා ගම

### 2.1 ගෙවතු සදහා බීජ අංකුර නිෂ්පාදනය ප්‍රජා සහයෝගිතාවය

ඉහතින් සදහන් කරුණු ගම්මාන වල පවත්වා ගෙන යනු ලබන බීජ ගොවිපල වල් වලින් ගෙවතු වගාවන් සදහා සුදුසු පැල සහ උස් බිම් වගාවන් සදහා යෝග්‍ය පැල වගී ද වගාකරනු ලැබේ. මේවා ගොවි පවුල් අතර බෙදා දෙනු ලැබේ. ඒ නිසාම වාරි මාගී වලින් ලැබෙන සීමිත ජල සැපයුමෙන් එලවලු වගිවන් කරගෙන යනු ලැබේ. දැන් මේ නිසා ඒ ප්‍රදේශ වාසීන්ට එදිනෙදා අවශ්‍ය වන එලවලු වගී මේ ආකාරයෙන් සපයනු ලැබේ. එමෙන්ම එයින් ප්‍රදේශ වාසීන්ටත් ඔවුන්ගේ ළමා ළපටින්ටත් අවශ්‍ය පෝෂණ පදාර්ථ සැපයීමද කෙරේ. මේ ක්‍රමය ඇතිකර ගනු ලැබූ පසු ඒ ප්‍රජාවට තිරසාර ආදායම් මාර්ගයක් සහතික කෙරේ.




## 2.2 ගෙවතු සදහා බීජ අංකුර නිෂ්පාදනය ප්‍රජා සහයෝගිතාවය

මහා සෘතුවේ වැසි ජලය ප්‍රයෝජනයට ගැනීම අරමුණු කර ගෙන ඒ කාල සීමාවට බෝංචි ඇට එලවලු ඇට මකදකෙද්‍රාක්කා සහ බතල කැරටි ගොවි ප්‍රජාවට සපයනු ලැබේ. ගොවි ජනතාව මේවා තමන්ගේ ඉඩම් වල වගා කිරීමට කටයුතු කරන අතර ඉන් ලැබෙන අස්වැන්නේ කොටසක් තමන්ගේ දෛනික අවශ්‍යතා සදහාද ඉතිරිවා සුලු ලාභයක් තබාගෙන විකිනීමද කෙරේ.




## 2.3 පලතුරු සහ සෙවනට ගස් වැල් සැපයීම

ගනේෂපුරම් සහ සේවා ගම්මානයේ ස්ථාපිත කර ඇති පැල තවාන් වල දැනට ඇති හරිතාගාර වල රතු පාට පැපොල් අඹ කොස් දෙහි යනාදිය වගාකොට ඇත. මේවා වර්ෂා සෘතුව සමයේදී එක පවුලකට පැල 8 ක් වනසේ පැල බෙදා දෙනු ලැබේ. මේවා ඔවුන්ගේ පුද්ගලික ඉඩම් වල වගා කල යුතු අතර සෙවනට සිටුවන ගස් ප්‍රසිද්ධ ස්ථාන වල වගා කල යුතුවේ.

මේ කායඝීය යටතේ ළදරු පාසැල්, පාසැල් සහ විවිධ සේවා සමුපකාර සමිති ශාලාවට පලතුරු පැල සහ සෙවනට සිටුවන ගස් වල පැල සපයා දී ඇත. මේවා විශේෂයෙන්ම ශිෂ්‍යයින් ගුරුවරුන් සහ දෙගුරුන් විසින් නඩත්තු කල යුතුය. සාමාන්‍ය ප්‍රජාවට විවිධ සේවා සමුපකාර ගොඩනැගිලි ප්‍රදේශය සහ ළදරු පාසැල් ප්‍රදේශ නඩත්තු කල යුතුය.




## 3 වන උප ලේඛණය - සේවා ගම්මානය සහ එහි සංවර්ධනය

### 3.1 අර්ධ නිවහන් ගොඩනැගීම



ශාන්ති පුරම් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ මෙහෙයවීමෙන් මැන්රිකැප් ආයතනයේ මූල්‍ය ආධාර සහ වෙනත් පහසුකම් සපයන්නා වශයෙන් ලැබුණු සහයෝගයෙන් ශාන්ති පුරම් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ මූලිකත්වයෙන් විවිධ සේවා සමුපකාර සමිති ගොඩනැගිල්ල තනා නිම කිරීමට හැකිවිය. මේ කරුණත් ශාන්ති පුරම් ප්‍රදේශ වාසීන්ගේ දීර්ඝ කාලීන පැතුමක් ඉෂ්ට විය. ඒ නිසා ඒ ප්‍රදේශ වාසී ජනතාවට උවමනා මූලික අවශ්‍යතාවයන් එකම මධ්‍යස්ථානයකින් පාලන මිලට ගැනීමට හැකිවී ඇත.

### 3.2 එලවලු අස්වැන්න නෙලීම

ගොවි සංවිධානයේ පූර්ණ වගකීම යටතේ පැල තවානේ වගා කරන ලද පහත සදහන් එළවලු වන බීට් රූට්, වම්බටු, මාලු මිරිස් තක්කාලි පලා කොල වගී මේවායින් කොටසක් ප්‍රජා සාමාජිකයින් විසින් බොහොම සතුටින් අනුභවයට ගනු ලැබූ අතර ඉතිරි ශේෂය ලාභයක් ඇතිව අලෙවි කරන ලදුව ගොවි සංවිධානයේ මූල්‍ය ප්‍රතිපාදන වලට එකතු කරන ලදී.

### 3.3 උස් බිම් වගාවන් කිරීම

ලගදී අත්පත් කර ගන්නා ලද ඉඩම් වල සීමිත ජල පහසුකම් වලින් ප්‍රයෝජන ගෙන සමහර එලවලු වර්ග වගා කරන ලදී. මෙය බොහොම ශුභ ලක්ෂණයක් වශයෙන් හඳුන්වා දිය හැක්කේ නුදුරු අනාගතයේදී වාරි පහසුකම් වලින් මේ ප්‍රදේශයට ජල පහසුකම් සැපයෙන විට මේ මුලු ප්‍රදේශයේ ම ගොවි ප්‍රජාව එලවලු වගාවට යොමු වනු ඇත.

### 3.4 ගැමි ප්‍රජාවට ජල සැපයුම

මේ ප්‍රදේශයේ වැව් සකස් කිරීම සහ වාරි පහසුකම් සැපයීමේ මූලික වැඩ කටයුතු දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම යෝජනා ක්‍රමය යටතේ ගැමි ප්‍රජාවට දැනට ඇති නල ලිං දෙකෙන් පොලොව මත සකස් කර ඇති ජල ටැංකියකට ජලය සපයන අතර එම ටැංකිය කොටස් හතරකට බෙදා වෙන්කොට ඉන් අසල ඇති නිවාස හතරකට ජල පහසුකම් සපයනු ලැබෙන අතර දැනට ගැමි ප්‍රජාව පයිප්ප දැමීමට අවශ්‍ය කානු සකස් කරමින් සිටී.

## 4 වන උප ලේඛනය : ගනේෂපුරම් ගමේ දියුණුව

කුණ සාගරම් සඟරාව දැනට මත් කලාප පහක් නිකුත් කොට අවසානය එහි බොහෝ විට දැනට ප්‍රදේශයේ තරුණ පරපුරට අවශ්‍ය ප්‍රවෘත්ති ඇතුලත් කොට ඇත.

### 4.1 මාවිරර් පුස්තකාලය

විවිධ සේවා සමුපකාර සමිති ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති පුස්තකාලයෙන් ගමේ ප්‍රජාවට පොත් පත් නවකතා සඟරා පුවත් පත් යනාදිය සපයා දෙනු ලැබේ.

### 4.2 සවස පන්ති

මේ පන්ති ආරම්භ කර පවත්වා ගෙන යෑමෙන් බලාපොරොත්තු වන්නේ ගමේ සිසු දරුවන්ගේ අධ්‍යාපනික හැකියාව පුලුල් කිරීමය. මේ කාරණය සඳහා ගමේ අධ්‍යාපනය ලැබූ තරුණයින්ගේ සහයෝගය මත අධ්‍යාපනික කටයුතු පවත්වා ගෙන යනු ලැබේ.

### 4.3 සිමෙන්ති බොලොක් ගල් සෑදීමේ ව්‍යාපාරය

මුරම් පිඩ්ඩි ගම් ප්‍රදේශයේ අර්ධ ස්ථිර නිවාස 250 ක් තැනීමට අවශ්‍ය සියලුම සිමෙන්ති බ්ලොක් ගල් සැපයීම කෙරුනේ ගනේෂපුරම් බ්ලොක් ගල් නිෂ්පාදන කණ්ඩායම විසිනි. ඒ ව්‍යාපෘතිය තුලින් ඔවුනට දෛනික වැටුප් ලබාගැනීමට හැකිවූ අතර එකී ග්‍රාම සංවර්ධන සමිතියට රුපියල් 26302 ලාභයක් ද ලබා ගැනීමට හැකිවිය.

## 5 වන උප ලේඛනය : පලි ආරු ගමේ සංවර්ධනය

මැන්රිකැප් මිනින්දෝරු මහතුන්ගේ සහාය ඇතිව අක්කර භාගයේ ඉඩම් කැබැලි 88 ක් බෙදා වෙන් කරන ලදී.

## 6 වන උප ලේඛනය : කුරෙයි සිතුවිතයාගකුලම් ගමේ සංවර්ධනය

ගොවි සංවිධානය සහයෝගීතාවයෙන් ප්‍රදේශයේ ප්‍රජාවගේ ආධාරයෙන් රතු තරුණීය නමින් හඳුන්වනු ලබන ගස් ලබු පොලිතීන් මලුවල පැල කරනු ලැබේ. ගොවි සංවිධාන මැන්රිකැප් ආයතනයේ අධීක්ෂණය යටතේ තිබෙන ග්‍රාමීය ප්‍රජාවට අලෙවි කිරීමේ වගකීම බාර කර ඇත. එයින් ලාභයක්ද ලැබිය යුතුව ඇත.



### 6.1 මිරිදිය මසුන්

මිරිදිය මසුන් බෝ කිරීමේ පරමාර්ථය ඇතිව කුරෙයි වැවට කුඩා මත්ස්‍ය පැටවුන් දහ දහසක් පමණ මුදා හැර ඇත. මේ නිසා මේ ගම්වල ප්‍රජාවට ප්‍රෝටීන් පදාර්ථ ඇතුලත් කෑම ගැනීමට අවස්ථාව සැලසී ඇති අතර වැඩුණු මසුන් ඇල්ලීමෙන් ලාභයක් ද උපයා ගැනීමට හැකිවී තිබේ.



### 6.2

මේ ගම්වල ජීවත්වන ප්‍රජාව ගතානුගතික වශයෙන් එලවලු වගාව සහ වෙනත් කුඹුරු වල වෙනත් ධාන්‍ය වගී වැවීමේ නිරත වී සිටිති ඔවුනට ඇති ප්‍රධානතම ගැටලුව වී ඇත්තේ ඔවුන් නිපදවන කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමට ඇති අපහසුවයි. මේ ගැටලුව මග හරවා ගැනීමට මැන්රිකැප් ආයතනයේ මන්නාරම දිසාපති කාර්යාලයේ සහයෝගීතාවය ඇතිව දිසාපති කාර්යාල භූමි ප්‍රදේශය තුල කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමට මං සලසා ඇත. මෙය

දෙයාකාර වාසියක් වී ඇත. කුරෙයි සහ සීඩ යන ගම්වාසී ප්‍රජාවට ඔවුන්ගෙ කෘෂි නිෂ්පාදන වැඩි මිලකට බටහිර මන්නායි වෙලද පොලේ මිලට වඩා අලෙවි කර ගැනීමට හැකි වී ඇති අතර මන්නාරම් වාසීන්ට අලුත් කෘෂි නිෂ්පාදන මන්නාරම් වෙලද පොලේ පවතින මිලට වඩා අඩුවෙන් මිලට ගැනීමට හැකිවී ඇත.

## 7 වන උපලේඛනය : පැල තවාන් - පොදු කායභීයන්

පලි ආරු, සිතු විනයානුකුලම් වටුපිතන් මඩ පුතුකකම් යන ගම් වල අලුත් පැල තවාන් පිහිටුව ඇත්තේ ප්‍රජා පාලන පුනරුත්තාපන ක්‍රමයකින්. ඒ ඒ ගම් වල පසෙහි තත්වය අනුව ඒ ඒ ගම්වල අවශ්‍ය පලතුරු ගස්, එලවලු පැල වෙනත් විසිතුරු පැල නිෂ්පාදනය කොට ගමේ ප්‍රජවට සපයන්නේ සාධාරණ මිලකටය. ඒ නිසා ගොවි ජනතාවන් ඒ වගේම ගොවි සංවිධානත් මේ නිසා හොද ප්‍රයෝජනයක් ලබයි.

## 8 වන උපලේඛණය : තෙනවාසි මරුනස්කුලම්

මේ ගමෙහි ගොවි පවුල් 26 ක් ජීවත් වෙයි. ඒ ගමේ පෙර පාසැලක් පවත්වා ගෙන යෑමට අවශ්‍ය ගොඩනැගිල්ලක් ගමෙහි නැත. ඒ වාගේම අනෙකුත් ප්‍රජාසංවර්ධන වැඩ කටයුතු ගැන රැස්වීමට ද තැනක් නැත. ඒ නිසා මේ සදහා අවශ්‍ය ගොඩනැගිල්ලක් සාදා නිමකර ගැනීම ඔවුන්ගේ අභිලාෂයයි. ඒ අනුව ගමේ ගොවි සංවිධාන මගින් මේ කායභීය සදහා ගොඩනැගිල් කටයුතු දැන් නිම කරගෙන යයි මේ ගමේ අනෙකුත් ගම් වල සහයෝගයද නොඅඩුව ලබාගැනීමට හැකිවිය.



## 9 වන උපලේඛනය පුතුකමාම්

මේ ගමේ අතුරු පාරවල් බොහොමයක්ම ඉතාම අබලන් තත්වයක පැවතුනි. ගමේ ප්‍රජාව රැස්වීම් ගමේ වැඩි වශයෙන් ම ප්‍රයෝජනයට ගන්නා මාර්ග ප්‍රමාණය කිලෝ මීටර 2.8 බව තීන්දු කර ගෙන ඒ පාරවල් නියම ලෙස පුනරුත්තාපනය කිරීමට ග්‍රාම සංවර්ධන සමිතිය භාර ගන්නා ලදී. ඒ කායභීයට ගමේ ප්‍රජාවගේ සම්පූර්ණ සහයෝගය ලබාගන්නා ලදී. මේ සදහා ගමේ කාන්තා පක්ෂය ඉතාම උනන්දුවෙන් සම්බන්ධ වී පාරවල් පස් කැපීම සහ තුනී කිරීම ශ්‍රමදායයෙන් කරන ලදී.



### 9.1 ඉහලින් පිහිට වු ජල ටැංකි

පුන්තුකමාම් ප්‍රදේශයේ ජීවත් වන ජනවාතවට පාසැල් ළමයින්ට ජල සැපයීමේ කටයුතු සදහා ජල ටැංකි දෙකක් ගොඩනගන ලදී. මේ කායභීය කලේ ග්‍රාම සංවර්ධන සමිතිය මගිනි. මේ ව්‍යාපෘතිය නිසා පාසැල් ළමුනට මෙන්ම ගමේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමට හැකිවී ඇත.

## 10 වන උපලේඛනය - වත්තුපිට මාඩු සහ සාමියාපුරම්

මේ ගම් දෙකේ විශේෂට නම් සාමියාපුරම් ගම්මානයේ පානීය ජලය ලබාගැනීම කලක සිට පැවතුන ප්‍රශ්ණයකි මේ ප්‍රශ්ණය නිරාකරණය කර ගැනීමේ අදහස ඇතිව නල ලිං පද්ධතියක් ඇති කර බීමට සුදුසු ජලය සැපයීම ආරම්භ කර ඇත. දැනට මුලු ගම් ප්‍රදේශයටම පානිය ජල පහසුකම් සපයා දීමේ අරමුනින් උස් බිම් වල ජලටැංකි බැදීමත් ඒ සදහා අවශ්‍ය ජල නල එලීමත් මේ දිනවල කරගෙන යනු ලැබේ. හැම නිවසකටම ජලනල වලින් ජලය සැපයීමට කටයුතු කරගෙන යන අතර වත්තුපිට්මාඩු ප්‍රදේශයේ උස්බිම් වල ජල ටැංකි දෙකක් බැදීමට ද කටයුතු කර ගෙන යනු ලැබේ. මේ අනුව මේ ප්‍රදේශයේ හැම නිවසකටම පානීය ජල පහසුකම් සපයාදීම ස්ථිර කර ඇත.





## 11 වන උපලේඛනය



පලතුරු ගස් සදහා කොම්පොස් සකස් කිරීමේදී භාගෙට දැවුණු දහයියා යොදා ගැනීම. මේ ගම්වල අඹ, කොස්, දෙහි, දෙලුම්, කජු සහ පේර වැනි පලතුරු වවනු ලැබේ. මේ පලතුරු සිටුවීමට පලමුව ඒ සදහා අවශ්‍ය වලක් සකස් කර ගැනීම ඉතාම වැදගත්ය.

මේ වල අඩි දෙකක් දිග අඩි දෙකක් පළළ අඩි දෙකක් ගැඹුර විය යුතුය. ඒ වලේ පලතුරු පැලයක් සිටුවීමට බලාපොරොත්තු වන දිනයට සතියකට කලින් කොම්පොස් පොහොර දමා සකස් කර ගත යුතුය. ඒ පොහොර මතුපිට පස වැලි සහ භාගෙට දැවුනු දහයියා එකකට එකක් වන ප්‍රමාණයට මිශ්‍රකර ගත යුතුව ඇත.

ගනේෂපුරම් සහ සේවා ගම යනාදී ගම්මාන වල පලතුරු පැන මේ ආකාරයෙන් සිටුවන ලදී. කලින් සදහන් කල පරිදි අඩි 2 දිග අඩි දෙකක් පළල අඩි දෙකක් උස ඇති වලවල් වල කොම්පෝස්ට් පොහොර යොදා පැල සිටුවන ලදී. කොම්පෝස් පොහොර දැමීමට කලින් වල අඟල් 6 පළල උසට භාගෙට දැවුණු දහයියා වලින් වල පුරවා ගන්නා ලදී. ඊට උඩින් කොම්පෝස් පොහොර දමන ලදී.

මේ ආකාරයට වල වල් සකස් කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන.

1. වේයන් ගෙන් වන හානිය සම්පුර්ණයෙන්ම වලක්වා ගත හැකිය

2. පැල ඉතාමත් ම ඉක්මනින් හා සවිමත්ව වැඩේ
3. දඟයියා පොතු වලට වතුර රදා පවත්වා ගැනීමේ ශක්තිය ඇති හෙයින් වාරි මාර්ග වලින් ජල පහසුකම් සැපයීම 50% අඩු කර ගත හැකිය.
4. වලෙන් ජලය වාෂ්පීකරණය වීම වල මතුපිට කොප්පෝස් තට්ටුවක් දැමීම නිසා අවම කර ගත හැකිය.
5. අවශ්‍යතාවයන්ටත් වඩා දඟයියා ඇති හෙයින් එයින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවීම